# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2114/55 - 2019 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2019.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයාට වහාම ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් විෂයයන් සහ කාර්යයන් පැවරීම සිදු කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නවින් දිසානායක,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2019 මාර්තු මස 15 දින.

උපලේඛනය

**ගරු වඩිවේල් සුරේෂ් , වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.<br><br>2. II තීරුවෙහි දක්වා ඇති ව්‍යවස්ථාපිත ආයතනවල විෂයපථයට අදාළවන බෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම | 1. පොල් සංවර්ධන අධිකාරිය<br><br>2. සීමාසහිත හලාවත වැවිලි සමාගම<br><br>3. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම<br><br>4. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම | • වෙනත් අමාත්‍යවරයකුගේ විෂය පථයට නිශ්චිතව පවරා නොමැති I වැනි සහ II වැනි තීරුවල සඳහන් කර ඇති විෂයයන්ට අදාළ සියලුම ව්‍යවස්ථාවන් |


1A - PG 4425 — 517 (2019/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 3. II තීරුවෙහි දක්වා ඇති ව්‍යවසායන්වල ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහල නැංවීම<br><br>4. II තීරුවෙහි දක්වා ඇති ව්‍යවසායන්වල බෝග මත පදනම් වූ එකතු කළ වටිනාකම වැඩිකිරීම සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br><br>5. II තීරුවෙහි දක්වා ඇති ව්‍යවසායන්වල අදාළ බලපත්‍ර නිකුත් කිරීම<br><br>6. බහු බෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් II තීරුවෙහි දක්වා ඇති ව්‍යවසායන්වලට අයත් ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම<br><br>7. II තීරුවෙහි දක්වා ඇති ව්‍යවසායන් සඳහා සංවර්ධන කටයුතු හඳුන්වා දීම<br><br>8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති සියලුම සංවර්ධන විෂයයන්ට ආදාළ කටයුතු<br><br>9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

03 - 1410

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.